සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

9 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 ශ්‍රී ලංකාවේ ගංගාවලින් 34 ක්ම මධ්‍යම කඳුකරයෙන් පටන්ගෙන .............................................. රටාවකට අනුව ගලා බසී.

(අරීය / වලයාකාර / ශාඛීය)

02 ''Dubai Mall'' යනු ලොව විශාලතම ........................................................................................ මධ්‍යස්ථානයයි.

(සන්නිවේදන / වෙළඳ / ක්‍රීඩා)

03 ජලවහනය හා පස ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන ............................................................. සාධකයකි.

(භෞතික / සංස්කෘතික / මානව)

04 වී වගාව, හේන් වගාව ආදී කෘෂිකාර්මික කටයුතු ශ්‍රී ලංකාවේ .................................... කලාපයේ දක්නට ඇත.

(වියළි / තෙත් / අතරමැදි)

05 හිමබල්ලා, සේවල්, මින්ක් වැනි සත්ත්ව විශේෂ .............................................. වනාන්තරවල දක්නට ඇත.

(පතනශීලී / නිවර්තන වර්ෂා / කේතුධර)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇත. ( )

07 ගැමි නාගරික ජනාවාසවල නාගරික ලක්ෂණවලට වඩා ග්‍රාමීය ලක්ෂණ ඇත. ( )

08 අමුඩේරියා හා සර්ඩේරියා ගංගා කැස්පියන් මුහුදට ගලා බසී. ( )

09 ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය වැඩිම දිස්ත්‍රික්කය ගම්පහ වේ. ( )

10 බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික යන ප්‍රධාන ආගම්වල නිජබිම වන්නේ ආසියාවයි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ලොව අඩුවෙන්ම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය වන්නේ,

(1) ගෝබි කාන්තාරය (2) අටකාමා කාන්තාරය

(3) තාර් කාන්තාරය (4) සහරා කාන්තාරය

12 ආසියා මහද්වීපයට අයත් දූපත් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) සුමාත්‍රා, තස්මේනියා (2) බෝර්නියෝ, මැඩගස්කරය

(3) තායිවාන්, ජාවා (4) හවායි, ශ්‍රී ලංකාව

13 ''ජකෝබාබාද්'' නගරය පිහිටා ඇත්තේ,

(1) ඇෆ්ගනිස්ථානය (2) පාකිස්ථානය

(3) ඉන්දියාව (4) බංග්ලාදේශය

14 අමුද්‍රව්‍ය හා ඛනිජතෙල් ආනයනය මත කර්මාන්ත පවත්වාගෙන යන ආසියානු රටක් වන්නේ,

(1) පිලිපීනය (2) සිංගප්පූරුව (3) ශ්‍රී ලංකාව (4) ජපානය

15 ශ්‍රී ලංකාවේ තෙවැනියට වැඩිම ජනගහනයක් ඇති දිස්ත්‍රික්කය වන්නේ,

(1) මහනුවර (2) කුරුණෑගල (3) ගම්පහ (4) කළුතර

- **අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට ගැලපෙන තොරතුර ''ආ'' තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

| | | | ''ආ'' |
|---|---|---|---|
| 16 රිටිගල, සීගිරිය, මිහින්තලය | (............) | A | කඩොලාන ව්‍යාප්ත ප්‍රදේශ |
| 17 හපුතලේ, ගලගෙදර, ගිනිගත්හේන | (............) | B | ශේෂ කඳු |
| 18 බූන්දල, කළමැටිය, ආනවිලුන්දාව | (............) | C | උස් කඳු මුදුන් |
| 19 තොටපොළ, කිරිගල්පොත්ත, නමුණුකුල | (............) | D | සානු |
| 20 මහනුවර, හැටන්, වැලිමඩ | (............) | E | කපොලු |
| | | F | තැනිතලා |

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) (i) පහත දැක්වෙන ආසියානු කලාප සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




(1) A අක්ෂරයෙන් දැක්වෙන කාන්තාරය නම් කරන්න.

(2) B අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න.

(3) සුලෙයිමාන් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(4) ලෝකයේ ප්‍රධාන කාර්මික රටක් වන ජපානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(5) G අක්ෂරයෙන් දැක්වෙන ජන හීන රට නම් කරන්න.

(6) K අක්ෂරයෙන් දැක්වෙන දූපත් සමූහය හඳුන්වන නම ලියන්න.

(7) නිතර ගංවතුර තර්ජනයට මුහුණ දෙන දකුණු ආසියාවේ රටක් දැක්වෙන අක්ෂරය කුමක් ද?

(8) H අක්ෂරයෙන් දැක්වෙන සානු ප්‍රදේශය නම් කරන්න. (ල. 08)

(ii) 1. යාබද සිතියමේ A, B හා C වලින් දැක්වෙන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ල. 03)

2. D අක්ෂරයෙන් දැක්වෙන තුඩුව නම් කරන්න. (ල. 01)

3. E අක්ෂරයෙන් දැක්වෙන බොක්ක නම් කරන්න. (ල. 01)

4. F අක්ෂරයෙන් දැක්වෙන කලපුව නම් කරන්න. (ල. 01)

5. B කලාපය තුළ පිහිටා ඇති ශේෂ කඳු දෙකක් නම් කරන්න. (ල. 02)




02



A B C

(i) ඉහත රූපවල A, B, C ලෙස දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් අයත්වන ප්‍රධාන අංශ පිළිවෙලින් දක්වන්න. (ල. 03)

(ii) ඉහත A හි දක්වා ඇති අංශයට අදාළ ආර්ථික ක්‍රියාකාරකම් 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) (a) ඉහත B රූප සටහන අයත්වන අංශයට අදාළ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිවශයෙන් ව්‍යාප්තව ඇති පළාත නම් කරන්න. (ල. 01)

(b) එම අංශයේ ව්‍යාප්තිය නිසා පැන නැගී ඇති පාරිසරික ගැටළු 2 ක් දක්වන්න. (ල. 04)

03 (i) පහත සිතියමේ A, B, C හා D ලෙස දක්වා ඇති ශ්‍රී ලංකාවේ ප්‍රධාන කඳුවැටි හතර නම් කරන්න. (ල. 04)




(ii) අංක 1, 2, 3 යටතේ දක්වා ඇති සානු ප්‍රදේශ පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ වැදගත්කම කරුණු 2 කින් දක්වන්න. (ල. 04)

04 (i) ආසියානු කලාපයට අයත් ඉපැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න. (ල. 04)

| මානව වර්ගය | ශාරීරික ලක්ෂණ | ජීවත්වන රටවල් |
|---|---|---|
| මොංගොලොයිඩ් | 1. ............................................<br>* මිටි අය මෙන්ම උස අයද සිටී | * ජපානය<br>2. ............................................ |
| 3. ............................................ | * හිසකෙස් රැළි ගැසුණු ස්වභාවයක් ඇත<br>* ශරීර වර්ණය තලෙළුය | 4. ............................................<br>* ශ්‍රී ලංකාව |

(iii) ජපානය ආසියාවේ ප්‍රධාන කාර්මික රටක් ලෙස වැදගත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ල. 04)

05 ශ්‍රී ලංකාවේ දේශගුණ කලාපවල පිහිටි ස්වභාවික වෘක්ෂලතා ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වෘක්ෂලතා වර්ගය | ව්‍යාප්ත ප්‍රදේශය | විශේෂ ලක්ෂණ |
|---|---|---|
| පහතරට තෙත් වනාන්තර | 1. ............................................<br>මොරපිටිය | * වනාන්තර වසර මුළුල්ලේම වැඩෙමින් පවතී<br>2. ............................................ |
| පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර | 3. ............................................<br>4. ............................................ | * වනාන්තර ලා කොළ පැහැයක් ගනී.<br>5. ............................................ |
| 6. ............................................ | පිදුරුතලාගල<br>8. ............................................ | 7. ............................................<br>* භූමියේ උස වැඩිවන විට ශාකවල උස ක්‍රමයෙන් අඩුවේ. |
| කඩොලාන | 9. ............................................<br>10. ............................................ | * ජලයෙන් ඉහළට විහිදුන වායුධර මුල් පවතී<br>11. ............................................ |

(ල. 11)

06 (i) ආසියාවේ වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් දෙක නම් කරන්න. (ල. 02)

(ii) යාබද ශ්‍රී ලංකා සිතියමේ A, B හා C වලින් දක්වා ඇති අඩු ජන ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක තුන නම් කරන්න. (ල. 03)

(iii) (a) සිතියමේ D හා E වලින් දක්වෙන වැඩිම ජන ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් නම් කරන්න.

(b) එම දිස්ත්‍රික්ක අයත්වන පළාත කුමක් ද?

(c) එම පළාත තුළ අධික ජන ව්‍යාප්තියක් ඇතිවීමට බලපා ඇති කරුණු 3 ක් ලියන්න. (ල. 06)




07 දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

1. ‘ලෝකයේ පියස්ස’ යන අන්වර්ථ නාමයෙන් හඳුන්වයි.
3. පාකිස්ථානයේ විශාලම වාරි පද්ධතිය සහිත ගංගාවයි.
5. ලොව උසම කඳු මුදුන වේ.
6. බොහෝ විට මේවා ජන ශුන්‍ය ප්‍රදේශ වේ.
7. ලොව ප්‍රධාන මෝටර් සයිකල් නිෂ්පාදන සමාගමකි.
9. ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය වනාන්තර ව්‍යාප්ත ප්‍රදේශයකි.

<u>පහළට</u>

1. ආසියාවේ පිහිටි විශාල කඳු පද්ධතියකි.
2. ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය අඩුම දිස්ත්‍රික්කය.
4. ආසියා මහාද්වීපය යුරෝපා මහාද්වීපයෙන් වෙන්කරන සීමාවකි.
8. ශ්‍රී ලංකාවේ අඩු ජන ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්කයකි.
10. ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ පිහිටා ඇති තුඩුවකි. (ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | අරීය | (02) | වෙළඳ | (03) | භෞතික | (04) | වියළි | (05) | කේතුධර | | | | |
| (06) | ✓ | (07) | × | (08) | × | (09) | × | (10) | ✓ | (11) | 1 | (12) | 3 | 
| (13) | 2 | (14) | 4 | (15) | 2 | (16) | B | (12) | E | (18) | A | (19) | C |
| (20) | D | | | | | | | | | | | | |

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) තාර් (ii) ඉරවඩි (iii) F (iv) C (v) මොන්ගෝලියාව
(vi) පිලිපීනය (vii) බංග්ලාදේශය (viii) ටිබෙට් සානුව

(ආ) (i) A වෙරළබඩ තැනිතලාව B අභ්‍යන්තර තැනිතලාව C මධ්‍ය කඳුකරය
(ii) සංගමන් කන්ද තුඩුව (iii) ආරුගම්බේ (ආරුගම් බොක්ක)
(iv) මීගමුව (v) ගෝවින්ද හෙල, කතරගම, සීගිරිය, රිටිගල

02 (i) A කෘෂි B කාර්මික C සේවා
(ii) සත්වපාලනය, බෝග වගාව, ධීවර කර්මාන්තය. තේ වගාව, රබර් වගාවට ලකුණු ලබාදෙන්න.
(iii) (a) බස්නාහිර
(b) ජල දූෂණය, වායු දූෂණය, ඝන අපද්‍රව්‍ය එකතුවීම, ඉඩම් හිඟය

03 (i) A නකල්ස් B පිදුරුතලාගල C සමනල D නමුණුකුල
(ii) 1. මහනුවර සානුව 2. වැලිමඩ සානුව 3. හැටන් සානුව
(iii) සංචාරක කර්මාන්තයට / ජෛව විවිධත්වය / තේ වගාවට / විසිතුරු මල් වගාව / සත්ව පාලනය / කිරි නිෂ්පාදන / පලතුරු නිෂ්පාදනය / එළවළු වගාව අදාළ පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.

04 (i) හොවැංහෝ / ඉන්දු නිම්න / මෙසපොතේමියානු (යුප්‍රටිස් - ටයිග්‍රිස්)
(ii) 1. හිසකෙස් කළුයි, කුරු වැනිය / ශරීරය කහ වර්ණයට හුරුයි / මුහුණ පැතලියි / ඇහිබැම වර්ධනය වී ඇත. / නාසය ගිලුණු ස්වභාවයක් ගනී
2. චීනය / මලයාසියාව / කොරියාව / සිංගප්පූරුව / තායිවානය ආදී
3. කොකසොයිඩ්
4. ඉන්දියාව / ඇෆ්ගනිස්ථානය / පාකිස්ථානය / අරාබි රටවල්
(iii) * මෝටර් රථ නිෂ්පාදනය
* විදුලි උපකරණ නිෂ්පාදනය / යන්ත්‍රෝපකරණ, යකඩ හා වානේ, නැව්, රසායන ද්‍රව්‍ය, රෙදිපිළි, පරිගණක හා පරිගණක උපාංග, රොබෝ තාක්ෂණය, ඖෂධ හා සැකසූ ආහාර නිෂ්පාදනය
* දළ ජාතික නිෂ්පාදිතයේ 27.5% කර්මාන්ත අංශය විසින් හිමිකර ගැනීම
* ශ්‍රම බලකායෙන් 26.2% ක් නිරත වන්නේ කාර්මික අංශයේ රැකියාවල
* අමුද්‍රව්‍ය සහ ඛණිජ තෙල් ආනයනය මත කර්මාන්ත පවත්වාගෙන යාම

05 පෙළ පොත 43 වන පිටුවේ සිට 49 පිටුව

06 (i) චීනය, ඉන්දියාව
(ii) A මුලතිව් B මන්නාරම C වවුනියාව
(iii) (a) D ගම්පහ E කොළඹ
(b) බස්නාහිර
(c) හිතකර දේශගුණ / යටිතල පහසුකම් (ප්‍රවාහන, සන්නිවේදන) / අධ්‍යාපන පහසුකම් / සෞඛ්‍ය පහසුකම් / රැකියා බහුල වීම / නාගරීකරණය / කර්මාන්ත බහුල වීම / සේවා මධ්‍යස්ථාන පැවතීම / අග නගරය වීම / වාණිජ නගරය වීම / වරාය, ගුවන්තොටුපල තිබීම

07 <u>හරහට</u>
1. ටිබෙට් සානුව 3. සින්දු 5. එවරස්ට් 6. කාන්තාර 7. යමහා
9. නාකියාදෙණිය

<u>පහළට</u>
1. ටියෙන්ෂාන් 2. නුවරඑළිය 4. යුරල් 8. මන්නාරම 10. දෙවුන්දර